ISSN 1991-040 x

# ගොවිකටයුතු පුවත් හසුන

වෙළුම 42   2018 තෙවැනි කලාපය   ජූලි - සැප්තැම්බර්









**හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය**

සමුළු වාර්තා

# ව්‍යාපෘති ක්‍රියාවට නැංවීම සහ ඇගයීම පිළිබඳ පුහුණු වැඩසටහන




කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා පිරිස අමතමින්

ග්‍රාමීය ජනතාවගේ ජීවන තත්ත්වය සංවර්ධනය කිරීම අරමුණු කර ගත් වැඩසටහන්, ව්‍යාපෘති හඳුනා ගැනීම, සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, ඇගයීම පිළිබඳ දැනුම කෘෂිකාර්මික හා ග්‍රාමීය සංවර්ධන ක්ෂේත්‍රයට සම්බන්ධ නිලධාරීන්ට ඉතා වැදගත් ය. හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය සහ ආසියා පැසිපික් කලාපයේ රටවල ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධනය සඳහා වූ ආයතනයේ (CIRDAP) සහයෝගීතා-වයෙන් මෙරට කෘෂිකර්ම ක්ෂේත්‍රයට සම්බන්ධ නිලධාරීන්ගේ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ දැනුම ඉහළ නැංවීමේ අභිලාෂයෙන් සංවිධානය කළ පුහුණු වැඩසටහනක් හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ දී 2018 සැප්තැම්බර් මස 3 වන දින පැවැත්වුණි.

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව, පළාත් කෘෂිකර්ම දෙපාර්තමේන්තු සහ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය නියෝජනය කරමින් නිලධාරීන් 30 දෙනෙකු පුහුණුලාභීන් ලෙස සහභාගී වූ මෙහි ප්‍රධාන ආරාධිතයා ලෙස සහභාගී වූයේ කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය වසන්ත අලුවිහාරේ මැතිතුමා ය. පුහුණු වැඩමුළුව සඳහා දේශීය මෙන් ම විදේශීය සම්පත් දායකයෝ රැසක් සහභාගී වූහ. සමාරම්භක උත්සවය අමතමින් කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍ය වසන්ත අලුවිහාරේ මහතා සඳහන් කළේ විශාල මුදලක් වැය කරමින් රජය විසින් විවිධ සංවර්ධන වැඩසටහන් ආරම්භ කළ ද එම වැඩසටහන්වල සාර්ථකත්වය මුළුමනින්ම රඳා පවතින්නේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නිලධාරීන්ගේ කැපවීම මත බවයි.

කෘෂිකර්මාන්තයේ දියුණුව හා අභිවෘද්ධිය සඳහා ඉහළ ප්‍රමුඛතාවයක් ලබා දෙමින් ජනාධිපතිතුමාගේ සංකල්පයක් මත තෙවසරක ආහාර නිෂ්පාදන වැඩසටහන ආරම්භ කර තිබේ. “වැව් දහසයි ගම් දහසයි” වැඩසටහන, ගොවීන්ට පොහොර සහනාධාරය ලබා දීමේ වැඩසටහන, කුඩා වාරි පුනරුත්ථාපන වැඩසටහන වැනි සංවර්ධන වැඩසටහන් රැසකට රජය විසින් විශාල මුදලක් වැය කර තිබේ. ග්‍රාමශක්ති, ගම් පෙරළිය හා එන්ටප්‍රයිසස් ශ්‍රී ලංකා වැඩසටහන් යටතේ ද විවිධ කෘෂිකාර්මික වැඩසටහන් ගණනාවක් ක්‍රියාත්මක කර තිබේ. කාන්තා කෘෂි ව්‍යවසායිකාවන් ගෙවතු වගා සඳහා දිරිමත් කිරීම සඳහා ඉතිහාසයේ පළමු වරට හඳුන්වා දුන් ‘සිතුමු’ ගොවි කාන්තා වැඩසටහන ද එවැන්නකි. විශාල මුදල් සම්භාරයක් වෙන් කරමින් රජය විසින් විවිධ සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ ද ඒවායෙහි සාර්ථකත්වය සම්පූර්ණයෙන් රඳා පවතින්නේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ නිරතව සිටින නිලධාරීන්ගේ කැපවීම මත බව සඳහන් කළ රාජ්‍ය අමාත්‍යතුමා වැඩමුළුවෙන් උපරිම ප්‍රතිඵල අත් කර ගන්නා ලෙස එයට සහභාගී වූ නිලධාරීන්ගෙන් ඉල්ලා සිටියේ ය.

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ මානව සම්පත් හා ආයතනික සංවර්ධන අංශය විසින් මෙම වැඩමුළුව සංවිධානය කරනු ලැබිණි.

# පර්යේෂණ පුවත්

## අවසන් කළ අධ්‍යයන

### ශ්‍රී ලංකාවේ එළවළු හා පලතුරු සැපයුම් දාමයන් හි ගුණාත්මකභාවය හා සුරක්ෂිතතාවය පිළිබඳ ගැටලු: විමර්ශනයක්

පලතුරු සහ එළවළු අංශය ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම ක්ෂේත්‍රයෙහි යහපත් වර්ධන ප්‍රවණතාවයක් ඇති කිරීම සඳහා වැදගත් වන අංශයක් වේ. ගොවීන්, එකතු කරන්නන් සහ වෙළෙඳුන් වැනි සැපයුම් දාමවල විවිධ පාර්ශවකරුවන් විසින් විවිධ වූ අවිධිමත් ක්‍රියාවල නිරත වීම ගැටලුවක් ව පවතී. ඒ හේතුවෙන් පසු අස්වනු හානිය නිසා ඇතිවන ගුණාත්මක ගැටලු සහ විවිධ හානිකර රසායනික ද්‍රව්‍ය මේවායෙහි අඩංගුවීම තුළින් මතුවන සුරක්ෂිතතා ගැටලු ශ්‍රී ලංකාව තුළ දැවෙන ප්‍රශ්නයක් බවට පත්වී තිබේ.

මෙම අධ්‍යයනයේ අරමුණු වූයේ ආහාර සුරක්ෂිතතා ගැටලු සම්බන්ධයෙන් සිදු වී ඇති බලපෑම විමර්ශනය කිරීම සහ එම ගැටලු අවම කර ගැනීමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීමයි. පලතුරු සහ එළවළු සැපයුම් දාමවල පවතින පසු අස්වනු හානි පිළිබඳ ගැටලු සහ ඒවා අවම කර ගැනීමට වර්තමානයේ ගෙන ඇති ක්‍රියා මාර්ග පිළිබඳ සමාලෝචනය කිරීම, පලතුරු සහ එළවළු සැපයුම් දාමවල අහිතකර ද්‍රව්‍ය අඩංගුවීම මඟින් ඇතිවන සුරක්ෂිතතා ගැටලු පිළිබඳ සමාලෝචනය, පලතුරු සහ එළවළු සැපයුම්දාමවල ගුණාත්මක තත්ත්වය සහ සුරක්ෂිතතාවය සම්බන්ධයෙන් පවතින ගැටලු අවම කර ගැනීම සඳහා ආයතනික මට්ටමෙන් ගෙන ඇති පියවර හඳුනා ගැනීම ද අධ්‍යයනයේ අරමුණු අතර විය.

ශ්‍රී ලංකාව තුළ එළවළු සහ පලතුරු නිෂ්පාදනයේ දී නුසුදුසු කෘමිනාශක සහ පොහොර භාවිතය, පසු අස්වනු හානි වළක්වාලීම සඳහා නිෂ්පාදනයේ සිට අලෙවිය දක්වා වූ සැපයුම් දාමවල නිසි ක්‍රමවේදයන් භාවිතා නොකිරීම හේතුවෙන් ඒවායෙහි ගුණාත්මක තත්ත්වය සහ සුරක්ෂිතතාවය කෙරෙහි බලපෑම් ඇති කර ඇති බව අධ්‍යයනයේ වැදගත් සොයාගැනීමකි. එළවළු සහ පලතුරු ප්‍රවාහනයේදී කැපුම්, කම්පන, යාන්ත්‍රික හානි, නුසුදුසු ඇසුරුම් භාවිතය (ගෝනි සහ පොලිප්‍රොපිලීන් බෑග්), ලොරිවල ධාරිතාවය ඉක්මවා ඇසුරුම් කිරීම හේතුවෙන් ප්‍රමාණවත් වාතාශ්‍රය ඒ තුළ නොපැවතීම, ගොවීන් සහ ප්‍රවාහනකරුවන් විසින් සිදුකරනු ලබන අක්‍රමිකතා, පැටවීමේදී සහ බෑමේදී සිදුවන අක්‍රමිකතා, ප්‍රවාහනය සඳහා ශීතකාරක කුටි සහිත වාහන නොමැති බව, හිරු එළිය සහ වැසිවලට නිරාවරණය වන පරිදි වාහනවල රැගෙනයාම වැනි ගැටලු හේතුවෙන් එළවළු සහ පලතුරු සඳහා අධික පසු අස්වනු හානියක් සිදු වන බව ද අධ්‍යයනය මඟින් පෙන්වා දෙයි.

එකී සොයා ගැනීම් පදනම් කර ගනිමින් පර්යේෂකයින් විසින් නිර්දේශ කිහිපයක් ඉදිරිපත් කර තිබේ. එළවළු සහ පලතුරුවල පසු අස්වනු හානිය අවම කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපත්ති සකස් කිරීමේ අවශ්‍යතාවය අධ්‍යයනය මඟින් නිර්දේශ කරනු ලබයි. රජය මඟින් පසු අස්වනු තාක්ෂණය වැඩිදියුණු කිරීමට අදාළ තත්ත්වයන් සඳහා අවශ්‍ය සම්පත් ප්‍රතිපාදනයට අදාළ පියවර ගත යුතුය. පළිබෝධනාශක භාවිතය සම්බන්ධයෙන් ගොවීන් දැනුවත් කිරීම හා අවශ්‍ය පුහුණුව ලබාදීම වැදගත් වේ. එසේම, ගොවිපළ තුළ දීම අස්වනු පිරිසිදු කිරීම, වියළීම, වර්ග කිරීම හා ඇසුරුම් කිරීම වැනි පසු අස්වනු පිළිවෙත් පිළිබඳව ගොවීන් දැනුවත් කිරීම හා පුහුණු කිරීම අවශ්‍ය වේ. ආහාර සුරක්ෂිතතාවය තහවුරු කිරීම ගොවියාගේ සිට නිෂ්පාදකයින්, සැකසුම්කරුවන් සහ පාරිභෝගිකයන් දක්වා වූ ජාලය තුළ (Farm to Fork) අදාළ තත්ත්වයන් සහතික කිරීම අවශ්‍ය වේ. ආහාර සුරක්ෂිතතාවය පිළිබඳ ජාතික ප්‍රතිපත්ති සැලසුම් කිරීම හා ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා රජය මැදිහත් විය යුතු අතර එය දේශීය මෙන්ම අපනයන වෙළෙඳපොළ සඳහා ගුණාත්මක නිෂ්පාදන ඉදිරිපත් කිරීම හා මිනිසාගේ සෞඛ්‍යාරක්ෂිතභාවය සුරැකීමට ඉවහල් වේ.

අලෙවි, ආහාර ප්‍රතිපත්ති අංශයේ ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රුවිනි විදානපතිරණ මහත්මියගේ සම්බන්ධීකරණයෙන් සිදු කෙරුණු මෙම අධ්‍යයනයේ සම පර්යේෂකයින් ලෙස ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රෝෂිණි රඹුක්වැල්ල මහත්මිය, පර්යේෂණ නිලධාරීන් වන නාලක විජේසූරිය මහතා සහ ජයමිණි චම්පිකා මෙනවිය යන පර්යේෂණ කණ්ඩායම කටයුතු කරති.

## ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණ සංකල්පය සංවර්ධනය කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පුරාතන ජල කළමනාකරණ ක්‍රමවේදයන්ගෙන් උගත හැකි පාඩම්



ශ්‍රී ලංකාවට යෝග්‍ය ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණ සංකල්පය සංවර්ධනය කර ගැනීමට හා එහි ප්‍රායෝගික භාවිතාව සඳහා උපයෝගී කරගත හැකි පුරාතන වාරි පද්ධතීන්හි පැවති සාර්ථක ජල කළමනාකරණ භාවිතාවන් හඳුනා ගැනීම මෙම අධ්‍යයන - යේ අරමුණ වී තිබේ. ශ්‍රී ලංකාවේ පුරාණ ගම් ආශ්‍රිත එල්ලංගා පද්ධතිය පිළිබඳව මෙහිදී ප්‍රධාන වශයෙන් අවධානය යොමු කර තිබේ.

පුරාතන ජල කළමනාකරණ ක්‍රමවේදයන් තුළ ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණයෙහි ප්‍රධාන මූලධර්මයන් ප්‍රායෝගිකව භාවිතයට ගෙන ඇති බව අධ්‍යයන සොයාගැනීම් පෙන්වා දෙයි. එල්ලංගා පද්ධතිය ශ්‍රී ලංකාවේ වියළි කලාපීය දේශගුණ තත්ත්වයන් යටතේ ජලය උපරිම කාර්යක්ෂමතාවයකින් කළමනාකරණය කිරීමට සමත් පද්ධතියක් විය. වර්ෂාව නොලැබෙන වියළි කාලවල දී ජලය භාවිතයට ගතහැකි ලෙස සංරක්ෂණය කිරීම පමණක් නොව අධික වර්ෂා කාලවල දී ජලයෙන් වන හානි ද එල්ලංගා පද්ධතිය තුළින් අවම විය.

මානව පද්ධතිය හා පරිසර පද්ධතිය අතර සමතුලිතතාවක් පවත්වා ගැනීම ද ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණ සංකල්පයේ අවධානයට ලක්වන මූලික කාරණයකි. ඒ අනුව ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ජීවන රටාව ආශ්‍රිත මානව ක්‍රියාකාරකම් හා පරිසර පද්ධතිය මනා සමතුලිතතාවයකින් මෙන් ම ඒකාබද්ධතාවයකින් පවත්වාගෙන යාම පුරාතන එල්ලංගා පද්ධතිය තුළ පැවති වැදගත් ලක්ෂණයක් විය. මෙම කරුණ ශ්‍රී ලංකාවට යෝග්‍ය ලෙස ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය තුළ සංකල්ප භාවිතා කිරීමේ දී සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණක් බව අධ්‍යයනය තුළින් පෙන්වා දී ඇත.

ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණයෙහි ප්‍රධාන මූලධර්මයෙන් වන සහභාගීත්ව ප්‍රවේශය පිළිබඳ වාරි ජල කළමනාකරණයේ දී වැඩි අවධානයක් යොමු කිරීම වැදගත් බව අධ්‍යයනය මඟින් වැඩිදුරටත් පෙන්වා දෙයි. එය ජලය පිළිබඳව ප්‍රජාවට ඇති අයිතිය ශක්තිමත් කිරීමට මෙන්ම ජල සම්පතෙහි තිරසර භාවිතයටද මහ පෙන්වීමකි. එමෙන්ම පුරාතන ජල කළමනාකරණ ක්‍රමවේදයන් තුළ කේන්ද්‍රීය අවධානයක් යොමු කළ මානව හා පාරිසරික පද්ධතීන්වල සමතුලිතතාවය පවත්වා ගෙන යාම ශ්‍රී ලංකාවට යෝග්‍ය ලෙස ඒකාබද්ධ ජල සම්පත් කළමනාකරණය සංකල්පය ප්‍රායෝගිකව භාවිතා කිරීමේ දී යොදාගත හැකි වැදගත් එළඹුමක් වේ.

පර්යේෂණ නිලධාරිණී උත්පලා ජයසිංහ මෙනෙවියගේ සම්බන්ධීකරණයෙන් සහ පර්යේෂණ නිලධාරිණී මාලතී රම්බොඩගෙදර මහත්මියගේ සම පර්යේෂකත්වයෙන් අධ්‍යයනය සිදු කෙරිණි.

# සිදු කරමින් පවතින අධ්‍යයන

## ‘සිතමු’ කාන්තා ගොවි සංවිධානවල තත්ත්වය සහ සවිබල ගැන්වීමේ අවශ්‍යතා හඳුනා ගැනීම



මෙම අධ්‍යයනයේ මූලික අරමුණ වන්නේ “සිතමු” කාන්තා ගොවි සංවිධානවල ව්‍යුහාත්මක හා ක්‍රියාත්මක විවිධත්වය අනාවරණය කිරීම තුළින් ශ්‍රී ලංකාවේ ගොවි කාන්තාවන් සවිබල ගැන්වීමේ ප්‍රතිපත්තිමය මැදිහත් වීම සඳහා පිටිවහලක් සැපයීමයි.

මෙම අධ්‍යයනයේ විශේෂිත අරමුණු වන්නේ

- අධ්‍යාපන මට්ටම, මූල්‍ය සහය, ව්‍යාවසායික අත්දැකීම්, පුහුණු අවස්ථා වැනි සාධක භාවිතා කර “සිතමු” කාන්තා ගොවි සංවිධාන කාණ්ඩ පහකට වර්ගීකරණය කිරීම
- කෘෂිකර්ම අමාත්‍යාංශය මඟින් කාන්තා ගොවි සංවිධාන ඔස්සේ අපේක්ෂා කළ අරමුණු ඉටු කර ගැනීමේ දී ඉහත සංවිධාන මුහුණ දෙන බාධක හා ඒවා ආශ්‍රිත දුර්වලතා හඳුනා ගැනීම
- ව්‍යවසායකත්ව සංවර්ධන සංරචකයේ ප්‍රගතිය සමාලෝචනය කිරීම සහ කාන්තාවන්ගේ ව්‍යවසායකත්ව අභිප්‍රායයන්ට බලපාන සාධක හඳුනා ගැනීම
- කාන්තා සංවිධානවල සාර්ථකත්වය සඳහා අවශ්‍ය මැදිහත්වීම් සහ ව්‍යවසායකත්ව සංවර්ධන සංරචකයේ ප්‍රවර්ධනය උදෙසා යෝග්‍ය යෝජනා ඉදිරිපත් කිරීම යනාදියයි.



මහනුවර, කුරුණෑගල, අනුරාධපුරය, යාපනය, මඩකලපුව, මොණරාගල යන දිස්ත්‍රික්කයන් හි ගොවිජන සේවා බල ප්‍රදේශ කේන්ද්‍ර කර ගනිමින් මෙම අධ්‍යයනය සිදු කිරීමට නියමිතය.

අධ්‍යයනයේ සම්බන්ධීකාරක ලෙස පර්යේෂණ නිලධාරිනි රිෆානා බුහාරි මහත්මිය කටයුතු කරන අතර ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරිනි රේණුකා වීරක්කොඩි මහත්මිය, පර්යේෂණ නිලධාරීන් වන තුෂාරා ධර්මවර්ධන මෙනවිය, දිනූෂා රත්නායක මහත්මිය, සහ අමල් දිසානායක මහතා ඇතුලු පිරිස පර්යේෂණ කණ්ඩායම ලෙස කටයුතු කරති.

## ශ්‍රී ලංකාවේ ගෙවතු තුළ පලතුරු වගාව කෙරෙහි බලපාන සාධක පිළිබඳ අධ්‍යයනය



ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන 2016-2018 යටතේ පලතුරු නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ගෙවතු වගාව ප්‍රචලිත කිරීම ප්‍රමුඛ ක්ෂේත්‍රයක් ලෙස හඳුනාගෙන තිබේ. ගෘහ ඒකක සහ ගෙවතු යොදාගෙන පලතුරු වගාවට අදාළව සිදු කර ඇති සමාජ ආර්ථික පර්යේෂණ සීමිත වේ. එමෙන්ම, ගෙවතු තුළ පලතුරු වගාව වැඩිදියුණු කිරීමේ වැඩසටහන් සැලසුම් කිරීමේ දී සහ ක්‍රියාත්මක කිරීමේ දී ඒ සඳහා බලපාන සමාජ ආර්ථිකමය සාධක සහ ගෘහ ඒකක, ඒ කෙරෙහි දක්වන ආකල්ප පිළිබඳ දැනුවත් වීම තුළින් ඒවා සාර්ථක කර ගැනීමේ හැකියාව පවතී. මේ හේතුවෙන් ගෙවතු තුළ පලතුරු වගාව ප්‍රචලිත කිරීමට බලපාන සමාජ ආර්ථික සාධක නිර්ණය කිරීම සඳහා මෙම අධ්‍යයනය ශ්‍රී ලංකාවේ දේශගුණික කලාප තුනෙහි ම (තෙත් කලාපය, වියළි කලාපය, අතරමැදි කලාපය) ක්‍රියාත්මක කරන ලදී.

ගෙවතු තුළ පලතුරු වගාව වැඩිදියුණු කිරීම කෙරෙහි බලපාන ගැටලු සහ විභවතා හඳුනාගැනීම මඟින් පලතුරු වගාව ප්‍රචලිත කිරීම සඳහා අවශ්‍ය උපාය මාර්ග ඉදිරිපත් කිරීම මෙම අධ්‍යයනයේ ප්‍රධාන අරමුණයි. තව ද, 2016-2018 ජාතික ආහාර නිෂ්පාදන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ගෙවතු තුළ පලතුරු වගාව වැඩිදියුණු කිරීමේ වැඩසටහනට අදාළව ඇගයීමක් ද සිදු කරන ලදී.

මෙම අධ්‍යයනය ගෘහ ඒකක 1517 ක් යොදා ගනිමින් දිස්ත්‍රික්ක 17 ක සිදු කරන ලද අතර පර්යේෂණ වාර්තාව සකස් කිරීමේ කටයුතු දැනට සිදු කෙරෙමින් පවතී.

පර්යේෂණ නිලධාරිනී යූ.ඩී.ආර් උදාරි මෙනවියගේ සම්බන්ධීකරණයෙන් සිදුවන මෙම අධ්‍යයනයේ සම පර්යේකවරුන් ලෙස ආචාර්ය ඩබ්.ඒ.ආර් වික්‍රමසිංහ මහතා සහ පර්යේෂණ නිලධාරිනී එම්.ඩී.ඩී. පෙරේරා මහත්මිය කටයුතු කරති.

### ජෙෆ්රි බාවා ඵලකය නිරාවරණය කිරීම

හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතන ගොඩනැඟිල්ල නිර්මාණය කළේ එදා මෙදාතුර ශ්‍රී ලංකාවේ බිහි වූ විශිෂ්ට ගෘහනිර්මාණ ශිල්පියෙකු වූ ජෙෆ්රි මැනිං බාවා මහතාගේ සැලැසුමකට අනුවයි. නූතන ගෘහ නිර්මාණ ශිල්පයට අද්විතීය මුහුණුවරක් එක් කළ ඔහුගේ විශිෂ්ට ගෘහ නිර්මාණ රැසක්ම දිවයින පුරා දැකගත හැකි ය.

අභියෝගාත්මක පරිසර තත්ත්වයන් හමුවේ ආලෝකය, අවකාශය සහ ද්‍රව්‍ය භාවිතා කරමින් නව වාස්තු විද්‍යා ක්‍රමවේදයන් ඉදිරිපත් කිරීම සඳහා ජෙෆ්රි බාව මහතාට පැවති හැකියාව හේතුවෙන් වර්තමානයෙදීත් ගෘහ නිර්මාණ ශිල්පය හදාරන දෙස් විදෙස් සිසුහු ඔහුගේ ගෘහ නිර්මාණයන්ගේ ඇසුර සොයා පැමිණෙති.

ඔහුගේ ගෘහ නිර්මාණ කුසලතාවයෙන් නිර්මාණය වූ මෙම අප ආයතන ගොඩනැඟිල්ල පිළිබඳව උනන්දුවක් දක්වන කාහටත් තොරතුරු දැන ගැනීමට හැකිවන පරිදි ආයතනයට ඇතුළු වන ප්‍රධාන දොරටුව අසල ඵලකයක් ස්ථාපිත කිරීම හිටපු අධ්‍යක්ෂවරයෙකු වූ කේ.ඩබ්.ඊ. කරල්ලියද්ද මහතාගේ සංකල්පයකි. ඒ අනුව, එම ඵලකය නිරාවරණය කිරීම පසුගියදා කෘෂිකර්ම අමාත්‍යාංශ ලේකම් බී. විජේරත්න හා වත්මන් අධ්‍යක්ෂ කරුණාදාස උඩගේ මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු විය.

# ක්ෂේත්‍ර දත්ත කඩිනමින් රැස් කිරීමට ටැබ් පරිගණක



එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ 'තිරසාර හා දේශගුණික විපර්යාස ප්‍රතිරෝධන ක්‍රමෝපායයන් වගා පද්ධතීන්ට අනුගත කිරීම පිළිබඳ කලාපීය උපාය මාර්ග හඳුන්වා දීමේ ව්‍යාපෘතිය' යටතේ ක්ෂේත්‍ර දත්ත එක්රැස් කිරීමේ ක්‍රියාවලිය වඩාත් කාර්යක්ෂම කිරීමේ අරමුණින් ටැබ් පරිගණක බෙදා දීම හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනයේ දී 2018 ඔක්තොම්බර් 15 දින සිදු විය.

එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානය හා හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය එක්ව සිදු කරනු ලබන මෙම ව්‍යාපෘතියේ සේවා සපයන්නා ලෙස කටයුතු කරන්නේ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයයි. අධ්‍යයනය සම්බන්ධයෙන් ආයතන දෙක අතර අත්සන් තබනු ලැබූ ගිවිසුම ප්‍රකාරව ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සැපයීමේ විධිවිධාන මත මෙම පිරිනැමීම සිදු විය.


එක්සත් ජාතීන්ගේ ආහාර සහ කෘෂිකර්ම සංවිධානයේ නියෝජ්‍ය (වැඩසටහන්) නියෝජිත ආචාර්ය ධර්ම ශ්‍රී විජේරත්න මහතා අතින් ටැබ් පරිගණක තොගය හෙක්ටර් කොබ්බෑකඩුව පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ අධ්‍යක්ෂ කරුණාදාස උඩගේ මහතා වෙත නිල වශයෙන් පිරිනැමුණි.


ව්‍යාපෘතියට අදාළව ක්ෂේත්‍රය තුළ දත්ත එක්රැස් කිරීමේ කටයුතුවල නිරතවන සංඛ්‍යාන නිලධාරීන්ට මෙතෙක් කලක් ගතානුගතික ක්‍රමයට සිදු කෙරුණු දත්ත එක්රැස් කිරීම, සංස්කරණය හා දත්ත කේතකරණය වැනි ක්‍රියාකාරකම් සංඛ්‍යාංකිත ක්‍රමයට ඉතාමත් සුළු කාලයක් ඇතුළත සිදු කිරීමට මේ තුළින් හැකියාව ලැබෙනු ඇත. එහි අවසන් ප්‍රතිඵලය ලෙස සකස් වුණු දත්ත සමුදායක් නිර්මාණය වන අතර විශ්ලේෂණය කටයුතු සඳහා අවශ්‍ය පරිදි දත්ත භාවිතා කිරීමේ හැකියාව පර්යේෂකයින්ට ලැබේ.


දත්ත ඇතුළත් කිරීමට අදාළ මෘදුකාංගය භාවිතා කිරීම සම්බන්ධයෙන් සංඛ්‍යාන සහකාරවරුන් පුහුණු කිරීමේ පුහුණු වැඩමුළුවක් ද මෙයට සමගාමීව ඉදිරියේ දී පැවැත්වීමට නියමිතය.


මෙම අවස්ථාවට ආහාර හා කෘෂිකර්ම සංවිධානය නියෝජනය කරමින් සහභාගී වූ එම සංවිධානයේ නියෝජ්‍ය (වැඩසටහන්) නියෝජිත ආචාර්ය ධර්මශ්‍රී විජේරත්න මහතා සඳහන් කළේ අනාගත පර්යේෂණ කාර්යයන් සඳහා මෙම ප්‍රදානයන් පන්නරයක් වනු ඇති බවත් ධාරිතා සංවර්ධන අංශයෙන් හැකි සෑම සහයක්ම පර්යේෂකයින් වෙනුවෙන් ලබා දීමට තම ආයතනය සූදානම් බවත් ය.


## නව ප්‍රකාශන











ගොවි කටයුතු පුවත් හසුන හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනයේ ප්‍රකාශන ඒකකය මඟින් පළ කෙරෙන ත්‍රෛමාසික ප්‍රකාශනයකි. ආයතනය සහ ගොවි කටයුතු ක්ෂේත්‍රයට අදාළ අනෙකුත් සංවිධාන මඟින් සිදු කෙරෙන පර්යේෂණ හා ක්‍රියාකාරී වැඩසටහන්වල දී ලබා ගන්නා පර්යේෂණ තොරතුරු මෙ මඟින් ප්‍රකාශයට පත් කෙරේ.

ලබාගත් මූලය සඳහන් කරමින් මෙහි ඇති කරුණු උපුටා ගත හැකි ය.

උපදේශකත්වය
කරුණාදාස උඩගේ
ප්‍රධාන විධායක නිලධාරී/අධ්‍යක්ෂ

අධීක්ෂණය
එස්.ඒ.සී.යූ. සේනානායක
ජ්‍යෙෂ්ඨ ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරී

සම්පාදනය
වසන්ති රාජපක්ෂ
ප්‍රවෘත්ති හා ප්‍රකාශන නිලධාරිනී (සිංහල)

නිර්මාණකරණය
උද්නි කරුණාරත්න
පරිඝනක අකුරු සැකසුම්කරු

අධ්‍යක්ෂ
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා
පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත, කොළඹ 07.
www.harti.gov.lk